ආයතනයේ නම	:	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක	:	77

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர்	:	நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்	:	77

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution	:	Ministry of Finance, Economic Stabilization and National Policies
Parliamentary Series	:	77

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආයතනයේ නම	:	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක	:	77

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 77

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

<u>පටුන</u>

අනු අංකය	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුව	පිටු අංකය
1.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	**1-18**

දෙපාර්තමේන්තුවේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 77

විමර්ශනය කරන ලද දිනය :- 2022 නොවැම්බර් 28

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය
01	**<u>Legacy</u> පරිගණක පද්ධතියට අදාළව, සමස්ථ හිඟ බදු, දඩ හා පොළී වටිනාකම** Legacy පරිගණක පද්ධතියට අදාළව, සමස්ත හිඟබදු, දඩ හා පොළී වටිනාකම වන රු. 261,925,187,280 න් රු. 189,748,978,400 ක් එනම්, 72% ක් අයකිරීම් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොළී ලෙස හඳුනාගෙන තිබීම සහ අයකල හැකි ආදායම වන රු. 72,176,208,180 ක් වූ හිඟ බදු හා දඩ මුදල මෙතෙක් අයකර ගෙන නොතිබීම.	2022.06.30 දිනට Legacy පරිගණක පද්ධතියට අදාළව සමස්ථ හිඟ බදු රු. 261,925,187,281.00 ක් වූ ප්‍රමාණය 2023.12.31 දින වන විට රු. 209,936,351,221.00 ක් දක්වා අඩු වී ඇත. එනම් Legacy පද්ධතියට අදාල හිඟ බදු රු. 51,988,836,060.00 ක ප්‍රමාණයක් 2023.12.31 දින වන විට අඩු කර ඇත. **<u>මුළු හිඟ බදු හා දඩ</u>** / **<u>තාවකාලිකව අත්හිටවූ බදු හා දඩ</u>** / **<u>අය කළ හැකි බදු හා දඩ</u>** **2022.06.30** 261,925,187,281 / 189,748,978,401 / 72,176,208,880 **2023.12.31** <u>209,936,351,221</u> / <u>159,645,625,334</u> / <u>50,290,725,887</u> නිරවුල් කිරීම් <u>51,988,836,060</u> / <u>30,103,353,067</u> / <u>21,885,482,993</u>
	Legacy පරිගණක පද්ධතියට අදාළ, අයකිරීම් තාවකාලිකව අත්හිට වූ එම හිඟ ආදායම් බදු, බදු අභියාචනා ක්‍රියාවලියේ (Tax Appeal Process) කුමන අදියරයන් (Stages) තුළ, කොපමණ ප්‍රමාණයන්ගෙන් පවතින්නේද යන්න පිළිබඳ සවිස්තර තොරතුරු ඉදිරිපත් කරන ලෙසට පෙර පැවැති ගිණුම් කාරක සභාවේදී නියෝග කළ ද, මෙතෙක් ඒ සම්බන්ධ තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් නොවූ බව කාරක සභාව හමුවේ අනාවරණය විය. මේ වන විට Legacy පරිගණක පද්ධතිය සංවෘත කොට (Closed) වසර 7 ක් ගතවී ඇතත්, එම පද්ධතියට අදාළ අයකළ හැකි ආදායම වන රු. 72,176,208,880 ක් වූ හිඟ බදු හා දඩ මුදල මෙතෙක් අයකර ගෙන නොමැති බව ද කාරක සභාව හමුවේ හෙළි විය.	Legacy පරිගණක පද්ධතියට අදාල 2023.12.31 දිනැති C 49 වාර්තාව පරිදි, • අය කිරීම් තාවකාලිකව අත්හිටවූ හිඟ බදු හා දඩ වලින් රු. 1,909,015,748.58 බදු අභියාචනා අවස්ථාවේ පවතී. • අය කිරීම් තාවකාලිකව අත්හිටවූ හිඟ බදු හා දඩ වලින් රු. 11,690,671,595.79 ක් බදු අභියාචනා ක්‍රියාවලියේ CGIR Hearing අවස්ථාවේ පවතින බවට හඳුනා ගෙන ඇති අතර, • බදු අභියාචනා කොමිෂන් සභාව තුළ අභියාචනා මට්ටමේ පවතින හිඟ බදු හා දඩ මුදල රු. 52,965,012,547.01 කි. තවද, Legacy පරිගණක පද්ධතියට අදාල හිඟ බදු අය කර ගැනීමේ කටයුතු වලට අදාල සංශෝධිත තක්සේරු නිකුත් කිරීම, ආපසු ගෙවීම් හිලව් කිරීම, ගෙවීම් මාරු කිරීම යනාදී කටයුතු Legacy පරිගණක පද්ධතිය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව Legacy පරිගණක පද්ධතිය සංවෘත කර ඇති බවට වන ප්‍රකාශය නිවැරදි නොවන අතර, ඉහත අදාල හිඟ බදු අය කර ගැනීම සඳහා පද්ධතිය සක්‍රීයව පැවතිය යුතු වේ.

02	**<u>RAMIS පරිගණක පද්ධතියට අදාළව, මුළු හිඟ බදු, දඩ හා පොළී වටිනාකම.</u>** **RAMIS** පරිගණක පද්ධතියට අදාළව, මුළු හිඟ බදු, දඩ හා පොළී වටිනාකම වන රු. 512,032,669,338 න් 75% ක් එනම්, රු.382,808,023,020 ක් අයකිරීම් තාවකාලිකව අත්හිට වූ බදු, දඩ හා පොළී ලෙසත්, රු. 129,224,646,318 ක් අය කර ගත හැකි හිඟ බදු හා දඩ ලෙසත් හඳුනාගෙන තිබීම.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හිඟ බදු අය කර ගැනීම සඳහා හිඟ බදු දැන්වීම් නිකුත් කිරීමෙන් අනතුරුව හිඟ බදු අය කර ගැනීමට ක්‍රියා කරන අතර මුළු හිඟ බදු ප්‍රමාණය එකවර ගෙවීමට අපහසුතා ඇති බදු ගෙවන්නන්ට ගෙවීම් සැලසුම් ලබා දීම කරනු ලබයි. එසේත් නොමැති අවස්ථාවලදී බැංකු ගිණුම් තහනම් කිරීම හා වෙනත් තෙවන පාර්ශව වලින් අය කර ගැනීමද සිදු කරනු ලබයි. ඉහත සඳහන් කරන ලද ක්‍රියා මාර්ග වලින් අයකර ගත නොහැකි අවස්ථා වලදී අධිකරණයේ නඩු පවරනු ලබයි. තවද බදු ගෙවන්නා විසින් ඉදිරිපත් කරනු ලබන විරෝධතා විසඳීම මඟින් ගොනුවේ වෙනත් බදු කාල පරිච්ඡේදයක හෝ බදු වර්ගයක ඇති ආපසු ගෙවීම් හිලව් කිරීම හෝ ගෙවීම් මාරු කිරීම් මඟින්ද හිඟ බදු ශේෂය නිරවුල් කිරීම සිදු කරයි. 2021 අංක 18 දරන මුදල් පනත ප්‍රකාරව හිඟ බදු කපා හැරීමෙන්ද හිඟ බදු ශේෂය අඩු විය. 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා දෙපාර්තමේන්තුවේ RAMIS පරිගණක පද්ධතියට අදාල හිඟ බදු පහත පරිදි අඩු කර ඇත. 2023/12/31 දිනට හිඟබදු එකතුකිරීම - 78,384,988,307.57 හිඟබදු කපා හැරීම <u>- 10,653,060,245.96</u> එකතුව <u>- 89,038,048,553.40</u>
	RAMIS පද්ධතිය පවත්වාගෙන යාම වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් 90 ක් පුහුණු කර ඇති බව හා 2014 වර්ෂයේ සිට නිලධාරීන් වෙනුවෙන් මාසිකව රු. මිලියන 3.091 ක ගෙවීමක් සිදුකරන බව ද මේ වන විට ඒ සඳහා රු. මිලියන 214.881 කට ආසන්න මුදලක ගෙවීමක් සිදුකර ඇති බවද කාරක සභාවේදි අනාවරණය විය.	RAMIS පද්ධතිය ප්‍රධාන මොඩියුල (CORE Modules) 21 කින් සහ අනෙකුත් මොඩියුල (Non-CORE Modules) 7 කින් සමන්විත තොරතුරු කළමනාකරණ පද්ධතියකි. මෙම පද්ධතිය නිර්මාණය කිරීම සඳහා සේවා සපයන්නකු තෝරා පත්කර ගන්නා ලද අතර එම සේවා සපයන්නා හට සහාය වීම සඳහා නිලධාරී මණ්ඩලයක්ද පත්කර ඇත. එම නිලධාරී මණ්ඩලයට අයත් රාජකාරි වන්නේ පද්ධතිය නිර්මාණය කිරීමට අවශ්‍ය තොරතුරු සේවා සපයන්නා වෙත ලබා දීම, එම තොරතුරු පදනම් කර ගනිමින් නිර්මාණය කරනු ලබන පද්ධතියේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම, පද්ධතිය නිලධාරීන් වෙත නිදහස් කළ පසු එහි යාවත්කාලීන කිරීම් අවශ්‍ය නම් සේවා සපයන්නා දැනුවත් කර එම යාවත්කාලීන කිරීම් සිදුකිරීම සහ පද්ධතියේ යම් වැඩිදියුණු කිරීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මැදිහත් වී කටයුතු කිරීම ආදියයි. මෙම නිලධාරී මණ්ඩලය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුල සේවයේ යෙදී සිටින නිලධාරීන් අතරින් බදු සම්බන්ධ දැනුම සහිත වඩාත් සුදුසු නිලධාරීන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2019 අනුව සම්මුඛ පරීක්ෂණය පවත්වා තෝරා පත්කර ගන්නා ලදී. මේ අනුව RAMIS පද්ධතිය පවත්වා ගෙන යාම වෙනුවෙන් නිලධාරීන් වෙත කරනු ලැබූ සියළුම ගෙවීම් කටයුතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2019 අනුව සහ මුදල් අමාත්‍යාංශයේ නිසි අවසරය ලබා ගැනීමෙන් අනතුරුව සිදු කර ඇත. තවද, මෙම ගෙවීම් අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු ගෙවීම් වන අතර, RAMIS පද්ධතිය නිර්මාණ කිරීම හා නඩත්තු කටයුතු වැනි අත්‍යවශ්‍ය සේවාවන් සැපයීම වෙනුවෙන් ගෙවීම් සිදු කොට ඇත.

	එසේම, 2016 වර්ෂයේ සිදුකරනු ලැබූ නව ආදායම් බදු සංශෝධනයන්ට අනුකූලව, RAMIS පරිගණක පද්ධතිය යාවත්කාලීන (Update) නොවීම පිළිබඳ හා RAMIS හා Legacy පරිගණක පද්ධතීන් ට අදාළව පවතින්නා වූ අයකළ හැකි මුළු ආදායම වන රු. බිලියන 201 කට ආසන්න හිඟ මුදල් අය කිරීම ප්‍රමාද වීමට හේතු හා ඒ සම්බන්ධව පවතින ගැටළු මොනවාද යන්න පිළිබඳ කාරක සභාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරී (ග.නි.) ගෙන් විමසිමක් කළේය. බදු ගෙවීම සඳහා ස්ථාපිත ස්වයං තක්සේරු පදනම යටතේ, බදු ගෙවන්නා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවන් සමඟ එකඟ විය නොහැකි අවස්ථාවන් හිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නැවත සළකා බලා තක්සේරු වාර්තාවක් නිකුත් කරන බවත්, ඉන්පසු බොහෝ විට එය අභියාචනා ක්‍රියාවලියට යොමුවන බවත් ග.නි. ප්‍රකාශ කළේය. එම අභියාචනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ විසඳිය නොහැකි වූ අවස්ථාවකදී බදු අභියාචනා කොමිසමටත්, ඉන්පසු අධිකරණයටත් යොමුවන බව කාරක සභාවේදී අනාවරණය විය. එළෙස අයකිරීම තාවකාලිකව අත්හිටවූ හිඟ බදු වලින් කොටසක් අධිකරණය විසින් ලබාදෙන තීන්දුව අනුව නැවත අයවීමට ද අවස්ථාව ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුව, Legacy පරිගණක පද්ධතියට අදාළව පවතින හිඟබදු, 2019 වර්ෂයට සාපේක්ෂව අද වන විට 50%කින් පමණ අඩුකරගෙන ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. ව්‍යාපාරිකයන් විසින් ඔවුන්ගේ ආදායම් ඉපයීම් මත මෙම හිඟ බදු හෝ වර්තමාන වර්ෂයට අදාළ බදු ගෙවනු ලබන බවත්, ඇතැම් අවස්ථාවන්හි දී එම හිඟ බදු වාරික වශයෙන් ගෙවීමට අවස්ථාව ලබාදී ඇති බැවින් බදු අයකර ගනු ලබන කාලසීමාවේ යම් ප්‍රමාදයක් පවතින බවද ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. <u>නිර්දේශ / නියෝග</u> - RAMIS හා Legacy පරිගණක පද්ධතීන් ට අදාළව එක් එක් ආයතනය මඟින් අය විය යුතු හිඟ බදු වෙන් වශයෙන්, අදාළ ආයතන වලින් එම හිඟ බදු අයකර ගන්නා ක්‍රමවේද (වාරික වශයෙන් සිදු කරනු ලබන ගෙවීම් ද ඇතුළත්ව) සහ එම ආයතන වලට අදාළ මුළු හිඟ බදු සම්පූර්ණයෙන් අයකර අවසන් කරනු ලබන දින වකවානු ඇතුලත් සවිස්තර වාර්තාවක් මාසයක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. /ග.නි. වෙත නියෝග කළේය. - RAMIS හා Legacy පරිගණක පද්ධතීන් ට අදාළව අයකිරීම් තාවකාලිකව අත්හිටවූ හිඟ බදු, දඩ හා පොළී පවතින ආයතන වෙන් වශයෙන් හා එම මුදල් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් දැක්වෙන සවිස්තර වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. /ග.නි. වෙත නියෝග කළේය. RAMIS හා Legacy පරිගණක පද්ධතීන් ට අදාළව අයකළ හැකි බදු හා එම හිඟ බදු අයකර ගැනීමේ ක්‍රමවේදය ඇතුළත් වාර්තාව ඉදිරිපත් කර ඇත.	

03	<u>බදු අභියාචනා ක්‍රියාවලිය</u> බදු අභියාචනා, අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වූ විට ඒවා විසඳීම සඳහා වැඩි කාළයක් ගතවන හෙයින්, බදු අභියාචනා වලට අදාළ අධිකරණ ක්‍රියාවළිය කාර්යක්ෂම කිරීම. පූර්ව ගිණුම් කාරක සභාවේදී ද මේ පිළිබඳව අවධානය යොමු වූ බවත්, බදු සම්බන්ධ නඩු සඳහා වෙනම අධිකරණ පද්ධතියක් නොමැති හෙයින්, එවැනි අධිකරණ පද්ධතියක් ඇති කිරීම පිළිබඳ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වරයා සමඟ සාකච්ඡා පැවැත් වූ නමුත් එය ක්‍රියාත්මක නොවූ බවත්, කාරක සභාව හමුවේ අනාවරණය විය. <u>නිර්දේශ / නියෝග</u> - බදු අභියාචනා කාර්යක්ෂමව විසඳා ගැනීමට අධිකරණ පද්ධතිය තුළ පවතින ක්‍රමවේදය ශක්තිමත් කරලීම උදෙසා වෙනම අධිකරණයක් (Separate Tax Court) ඇති කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව අවධාරණය කළ අතර, ඒ සඳහා අවශ්‍ය සංශෝධන ඇතුළත් යෝජනාවක් කාරක සභාව වෙත සති දෙකක් තුළ ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කළේය. - එම සාශෝධන ඇතුළත් යෝජනාවලිය ලද පසු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්, දේශීය ආදායම් පනත සංශෝධනය සඳහා අවශ්‍ය යෝජනා ගරු. අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බව කාරක සභාව ප්‍රකාශ කළේය. මීට අදාළව පහත යෝජනා ඇතුළත් පිළිතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 02) • නීතිමය රාමුව සහ පරිසරය සැකසීම • බදු විෂයය සම්බන්ධ මනා අවබෝධයක් ඇති විනිසුරුවන් පත් කිරීම • නඩු විභාග කර නීන්දුව ප්‍රකාශ කිරීමට නිශ්චිත කාල රාමුවක් සැකසීම හා එය ප්‍රායෝගිකව අදාළ කර ගතහැකි දැයි පරීක්ෂා කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් / නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසීම • අධිකරණ මණ්ඩල සංඛ්‍යාව වැඩි කිරීම	අදාළ අංශ සමඟ සාකච්ඡා කරමින් අවශ්‍ය පරිදි යෝජනා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරමින් පවතී.

04	<u>එකතු කළ අගය මත බදු (VAT) අයකර ගැනීම</u> අයකර ගත හැකි මුළු හිඟ බදු වටිනාකමින් රු. 116,350,240,272 ක් (58%) මහජනතාවගෙන් සෘජුවම හා වක්‍රාකාරව අය කර ගන්නා එකතු කළ අගය මත බදු (VAT) වලින් සමන්විත අතර දෙපාර්තමේන්තුව විසින් එම බදු කාලානුරූපීව ප්‍රේෂණය කර ගැනීමට අවශ්‍ය පියවරයන් ක්‍රියාත්මක කර නොතිබීම. උක්ත හිඟ බදු වටිනාකම තුළ රාජ්‍ය ආයතන 05ක් වෙතින් තෙවන පාර්ශවයන් විසින් හාන්ඩ හා සේවා මත අයකර එසේ දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකළ එකතු කළ අගය මත බදු රු. 193,828,962 ක් වන අතර, එම මුදල රැස්කරන පාර්ශවයන් ට අයථා පරිහරණයට ඉඩ සැලසී ඇති බවත්, දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා කාර්යක්ෂම හා ඵලදායී පියවර ගෙන නොමැති බවත් කාරක සභාවේ දී අනාවරණය විය. <u>නිර්දේශ / නියෝග</u> - එම එකතු කළ අගය මත බදු (VAT), දෙපාර්තමේන්තුව වෙත අයකර ගැනීමට අදාළව සුදුසු පියවර ගන්නා ලෙසත්ථ එලෙස බදු අය කර ගනු ලබන ක්‍රමවේදය ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. **මීට අදාළ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර ඇත.**	එකඟ වෙමි. 2023.12.31 දිනට ප්‍රගතිය මේ සමඟ අමුණා ඇත (**ඇමුණුම - 01**).
05	<u>ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) නිසි ලෙස ක්‍රියාත්මක නොවීම</u> දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සඳහා රු. බිලියන 10කට ආසන්න මුදලක් වැයකර ඇතත් මෙතෙක් නිසි පරිදි එය ක්‍රියාත්මක නොවීම. මුදල් අමාත්‍යාංශය හා සිංගප්පූරු රජය අතර ඇති කර ගත් ගිවිසුමකට අනුව, සිංගප්පූරු රජයේ විදේශ අමාත්‍යාංශය යටතේ ඇති Singapore Corporation Enterprise (SCE) ආයතනයට RAMIS පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බවත්, මෙහි ක්‍රියාකාරී කොටස සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ බවත් ග.නි. ප්‍රකාශ කළේය. මෙහි මෘදුකාංග සංවර්ධන (Software Development) කටයුතු සිදුකරනු ලබන්නේ, බදු පරිපාලනය සම්බන්ධයෙන් මෘදුකාංග සංවර්ධනය කරනු ලබන NCS නම් සිංගප්පූරු සමාගම විසින් බවද කාරක සභාවේදී අනාවරණය විය. 2014 වර්ෂයේ ජූලි මාසයේ ආරම්භ වූ RAMIS ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ ඔක්තෝබර් අවසන් වන විට රු. බිලියන 8.8ක වියදමක් දරා ඇති බවත් 2015 වර්ෂයේදී RAMIS පද්ධතියේ, වෙබ් ද්වාරය	මෙම නිගමනය නිවැරදි නොවේ. වසර 2014 දී ආරම්භ වූ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) වසර 2016 ඔක්තෝබර් මාසය වන විට සම්පූර්ණ ක්‍රියාකාරී තත්වයට පත් කරන ලදී. පසුව වසර 2017 ඔක්තෝබර් මාසයේදී 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හඳුන්වා දුන් අතර, එය 2018 අප්‍රේල් 01 දින සිට බලාත්මක කරන ලදී. එම පනත එතෙක් පැවති 2006 අංක 10 දරණ පනතට වඩා ව්‍යුහාත්මකව වෙනස් පනතක් වූ බැවින් එතෙක් ක්‍රියාත්මක වූ RAMIS නව පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා නොගැලපුණි. ඒ අනුව RAMIS හි සම්පූර්ණ ව්‍යුහාත්මක වෙනසක් සිදුකළ යුතු වූ අතර ඒ අනුව RAMIS 2.0 නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණේ 2018 නොවැම්බර් මස අගදීය, ඒ අනුව RAMIS 2.0 යෝජනාව සහ මිල ගණන් කැඳවා එය ඇගයීමට ලක් කිරීමෙන් පසුව නැවත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ අතර ඒ සඳහා 2020 පෙබරවාරි මාසයේදී අනුමැතිය ලබා දී ඇත.

	(Web Portal) නිර්මාණය කළ බව හා අදියර කිහිපයකින් ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතියේ කටයුතු 2016 ඔක්තෝම්බර් මාසය වන විට අවසන් කළ බවත් ග.නි. ප්‍රකාශ කළේය. ගිවිසුම් ප්‍රකාරව, වසර 04ක කාලයක් සඳහා තාක්ෂණික යාවත්කාලීන කිරීම් සහ නඩත්තු සේවා සිංගප්පූරු සමාගම විසින් සිදුකළ යුතු බවද කාරක සභාවේදී අනාවරණය විය. එසේ වුවද, 2017 වර්ෂයේදී සම්මත කරනු ලැබූ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා RAMIS පද්ධතියේ නව ව්‍යුහාත්මක වෙනස්කම් හා සංවර්ධනයන් සිදු කිරීම අවශ්‍ය වූ බැවින් මෙම පද්ධතියෙහි උපදේශක (Third Party Quality Assurance) ලෙස කටයුතු කරනු ලබන මොරටුව විශ්වවිද්‍යාලය සම්භද සාකච්ඡා කර, එම පද්ධතියෙහි මීළඟ අදියර (Next Version), RAMIS2.0 ලෙස සංවර්ධනය කිරීමට තීරණය කළ බව ග.නි. ප්‍රකාශ කළේය. මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලද පසු නීතිපතිතුමාගේ උපදෙස්ද ලබා ගත් බවත්, පැවති කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව අත්සන් කිරීම සිදු වූයේ 2020 ජූලි මාසයේ බවත් කාරක සභාවේදී අනාවරණය විය. ගිවිසුම් ප්‍රකාරව මෙම පද්ධතියේ ගෙවීම් කටයුතු, අදියර වශයෙන් ගෙවීමේ ක්‍රමය හරහා (Milestone Payment System) සිදු වන බවත්, ඉන්වොයිස් නිකුත් වුවද රට තුළ පවතින ඩොලර් අර්බුදය හේතුවෙන් සිංගප්පූරු ඩොලර් මිලියන 9.1ක (ඇමරිකන් ඩොලර් මිලියන 6.6ක්) මුදලක් තව දුරටත් හිඟ බවත් ග.නි. ප්‍රකාශ කළේය. තවද ශ්‍රී ලංකාව ණය ශ්‍රේණිගත කිරීම් වල පහත හෙළීම (downgrade) හේතුවෙන්, සිංගප්පූරු සමාගම සමඟ ණයට ගණුදෙනු කිරීමේ ගැටළු උද්ගත වූ බවත් ඒ අනුව 2022 ජූනි මාසයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය නැවතුන බව හා පද්ධතියේ නඩත්තු කටයුතු පමණක් සිංගප්පූරු සමාගම විසින් සිදු වන බව කාරක සභාව හමුවේ අනාවරණය විය. නව බදු පනත ක්‍රියාත්මක කිරීමෙන් පසු, 2018/2019, 2019/2020,2020/2021 තක්සේරු වර්ෂ සඳහා බදු ගෙවන්නන් ලබා දී ඇති වාර්තා පද්ධතිය තුළ සකස්වන බවත් (Processing), ගැටළු සහිත බදු වාර්තා පවතී නම් ඒවාට අදාළ නව තක්සේරු නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාළ කටයුතු මේ වන විට ඇණ හිට ඇති බවත්, RAMIS පද්ධතියේ වර්තමාන ක්‍රියාකාරිත්වය පිළිබඳ අදහස් දක්වමින් ග.නි. ප්‍රකාශ කළේය. ආදායම් පනත් කලින් කළ වෙනස් විය හැකි බැවින් හා ඊට අනුකූලව පද්ධතිය තුළද වැඩිදියුණු වීම් (Upgrade) හා වෙනස්කම් සිදු විය යුතු බැවින්, එලෙස සිදු වන වෙනස් වීම් හා වැඩිදියුණු කිරීම් කොන්ත්‍රාත්තුව භාරගත් සමාගම විසින් සිදු කළ යුතු බවට මුල් ගිවිසුමෙහි, කොන්දේසි ඇතුළත්ව නොතිබුනේද යන්න පිළිබඳ කාරක සභාව විමසීය.	තවද, 2020 වසරේ මාර්තු මාසය වන විට COVID වසංගත තත්වය ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකාව, සිංගප්පූරුව මෙන්ම ලොව බොහෝ රටවල් වසා දමන ලදී. මෙම කාලයේ රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කිරීම සිදු විය. එබැවින් RAMIS 2.0 වැඩිදියුණු කිරීමට අවශ්‍ය සියළු කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට කටයුතු කරන ලදී. එය සාමාන්‍ය ක්‍රමවේදයට අනුව සේවා යෝජකයා හා සේවා දායකයා සම්මුඛ ලෙස සාකච්ඡා කර අවශ්‍ය තොරතුරු රැස් කිරීමට වඩා බොහෝ අපහසුතා මධ්‍යයේ සිදු කරන ලද කාර්යයකි. මෙහිදී දුරකතන පද්ධති බිඳ වැටීම්, විදුලිය විසන්ධි වීම, දෙපාර්ශවයේම නිලධාරීන්ට කොවිඩ් වැළඳීම ආදී කරුණු හේතුවෙන් බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ව්‍යාපෘති සංවර්ධනය සඳහා ගතවූ අතර, නිලධාරීන් විසින් දිවා රාත්‍රී නොබලා අදාල කටයුතු සිදු කරන ලදී. එම කැපකිරීම්වල ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන කටයුතු 2022 මැයි මාසය වන විට අවසන් කිරීමට බලාපොරොත්තු විය. තවද, රට තුළ පැවති දේශපාලන මෙන්ම සමාජ අස්ථාවරත්වය, ඉන්ධන නොමැතිවීම හේතුවෙන් නොාසන්සුන්තා ඇති විය. එවකට ඇති වූ විදේශ විනිමය හිඟය හේතුවෙන් 2021 වසරේ සිට ගෙවීමට තිබූ බිල්පත් නොපියවීම සහ රට බංකොලොත්භාවය ප්‍රකාශයට පත්කිරීම ආදී කරුණුවල අතුරුඵල ලෙස අඩපණ වූ RAMIS 2.0 සංවර්ධන කටයුතු NCS ආයතනය විසින් 2022 ජූනි මස 01 දින සිට අත්හිටුවන ලදී. පසුව COPA කමිටුවේ මැදිහත්වීම මත අදාල හිඟ මුදල්, මුදල් අමාත්‍යාංශය විසින් ගෙවා අවසන් කළ අතර, 2023 පෙබරවාරි මස 01 දින සිට සංවර්ධන කටයුතු නැවත ආරම්භ කරන ලදී. ඒ අනුව මේ වනවිට අදාල සංවර්ධන කටයුතු නිමකර ඇති අතර, මූලික වශයෙන් අරමුණු කරන ලද 2018/2019 සඳහා තක්සේරු නිකුත් කිරීමට හැකිවන පරිදි පද්ධතිය යථාවත් කර ඇත. එසේම 2019/2020, 2020/2021, 2021/2022 සහ 2022/2023 සඳහා තක්සේරු නිකුත් කළ හැකි වන පරිදි පද්ධති වෙනස්කම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර ඇත. මේ සඳහා අදාළ ඉල්ලීම් පද්ධති සංවර්ධක වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද, තක්සේරු වර්ෂ 2018/2019, 2019/2020, 2020/2021 හි රාජ්‍ය ආදායම අහිමි වීම වැලැක්වීම උදෙසා කාල කඩඉම් ඉකුත් වීමට ප්‍රථම විකල්ප ක්‍රමවේදයක් යටතේ නිසි කලට අතිරේක තක්සේරු නිකුත් කිරීමට දේශීය ආදායම් කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ අනුව බදු ආදායම අහිමි වීම වලක්වා ගෙන ඇත. ආදායම් බදු පනතට කලින් කල සිදුකරනු ලබන වෙනස්වීම්වලට අනුකූලව පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අදාල කොන්දේසි මුල් ගිවිසුමෙහි ඇතුළත්ව ඇති අතර, එය “Change Request Process” ක්‍රමවේදය යටතේ සිදු කළ හැක

	නව බදු ක්‍රමයක් හඳුන්වා දුන් විට "Change Request Process" ක්‍රමවේදය හරහා පද්ධතියෙහි වෙනස්කම් සිදු කළ හැකි බවත්, 2017 වර්ෂයේ හඳුන්වා දුන් නව බදු පනතෙහි පැවති ව්‍යුහාත්මක වෙනස්කම් හේතුවෙන් පද්ධතියෙහි වෙනම අදියරක් (Version) සංවර්ධනය කිරීමට සිදු වූ බවත් ග.නි. ප්‍රකාශ කළේය.	
06	<u>රාජ්‍ය ආයතන **RAMIS** පද්ධතිය හා සම්බන්ධ වීම</u> RAMIS පද්ධතිය හා සම්බන්ධ විය යුතු ආයතන 29ක් පැවතියද මේ වන විට අත්‍යවශ්‍ය රාජ්‍ය ආයතන 6ක් පමණක් RAMIS පද්ධතිය හා සම්බන්ධ කර ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. මෙලෙස RAMIS පද්ධතිය හා ආයතන සම්බන්ධ කිරීමේදී එලෙස සම්බන්ධ වන අනෙක් ආයතනයේද ස්වයංක්‍රීය පද්ධතියක් (Automated System) පැවතිය යුතු බවත් එම පද්ධතීන් අතර දත්ත සම්බන්ධ (Link) කිරීම සඳහා පොදු විද්‍යුත් හඳුනාලැනීමේ අංකයක් (Unique Digital ID) පැවතිය යුතු බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. නමුත් රජයේ ආයතන දත්ත සම්බන්ධ (Link) කිරීම සඳහා එවැනි පොදු හඳුනාගැනීමේ අංකයක් නොමැති බැවින්, ජාතික මට්ටමින් එවැනි හඳුනාගැනීමේ අංකයක් හඳුන්වාදීමේ අවශ්‍යතාවය හා එය භාවිතයෙන් සියලුම වාණිජ ගණුදෙනු ක්‍රියාත්මක කිරීමේ හැකියාව කාරක සභාවේ අවධානයට යොමු විය. මෙහිදී අදහස් දක්වමින් ග.නි. සඳහන් කළේ, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් සිය දත්ත පද්ධතිය තුළ වාහන අයිතිකරුගේ NIC අංකය වෙනුවට වැසි අංකය භාවිත කරන බවත් එම අංකය RAMIS පද්ධතිය තුළ නොමැති වීමෙන් පද්ධතියට සම්බන්ධ වීමේ (Link) ගැටළු පවතින බවත්ය. නමුත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව භාවිත කරනු ලබන TIN අංකය (Taxpayer Identification Number) කටයුතු කරනු ලබන ආයතන වල (උදා-ශ්‍රී ලංකා රේගුව විසින් ආනයන අපනයන කටයුතුවලදී TIN අංකය භාවිතා කිරීම) දත්ත RAMIS පද්ධතියට ස්වයංක්‍රීයව එකතු වන බව ග.නි. ප්‍රකාශ කළේය. <u>නිර්දේශ/නියෝග</u> - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා RAMIS පද්ධතියට සම්බන්ධ අනෙකුත් අදාළ ආයතන, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියට සම්බන්ධ කරලීමේදී පවතින ගැටළු නිරාකරණය කිරීමට සුදුසු යෝජනා මාසයක් තුළ ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. **මේ සම්බන්ධ පිළිතුරු වාර්තා ඉදිරිපත් කර ඇත.(ඇමුණුම 03)**	මේ වන විට අවශ්‍ය යටිතල පහසුකම් සපුරා ඇති පහත නම් සඳහන් අත්‍යවශ්‍යම රාජ්‍ය ආයතන 6 ක් RAMIS පද්ධතිය හා සම්බන්ධ කර ඇත. 1. මහජන බැංකුව, ලංකා බැංකුව — බදු ගෙවීම් පමණක් සම්බන්ධ කර ඇත 2. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව 3. මුදල් අමාත්‍යාංශය 4. රේගු දෙපාර්තමේන්තුව 5. ලංකා ක්ලියර් පුද්ගලික සමාගම අනෙකුත් ආයතන RAMIS පද්ධතිය සමග සම්බන්ධ කර ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර ඇත. කෙසේ වෙතත් මේ වන විට පහත නම් සඳහන් ආයතන RAMIS පද්ධතිය හා සම්බන්ධ කිරීමේ අවසන් අදියරේ පවතී. 1. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2. ආගමන විගමන දෙපාර්තමේන්තුව 3. සුරාබදු දෙපාර්තමේන්තුව

	- තවද, පූර්ව ගිණුම් කාරක සභාවේ නිර්දේශය මත මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පත්කළ කමිටුව විසින් RAMIS පද්ධතියට සම්බන්ධ ආයතන 29 සමඟ පැවැත්වූ සාකච්ඡාවන් හි වාර්තා, කාර්ය සටහන් හා එහි ප්‍රගතිය මසක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි. වෙත නියෝග කළේය. - **උක්ත සඳහන් RAMIS පද්ධතියට සම්බන්ධ ආයතන 29 සමඟ පැවැත්වූ සාකච්ඡාවන් හි වාර්තා, කාර්යය සටහන් ඉදිරිපත් කර ඇත.**	
07	<u>RAMIS පරිගණක පද්ධතිය සම්පූර්ණයෙන් කඩිනමින් ක්‍රියාකාරී තත්වයට පත්කිරීම.</u> <u>නිර්දේශ/නියෝග</u> - RAMIS පරිගණක පද්ධතිය සම්පූර්ණයෙන් කඩිනමින් ක්‍රියාකාරී තත්වයට පත්කිරීම සඳහා RAMIS පරිගණක පද්ධතිය සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු ඇතුළත් වාර්තාවක් මාසයක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. /ග.නි. වෙත නියෝග කළේය.	
	• RAMIS පරිගණක පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාකාරී තත්වයට පත් කිරීම සඳහා ගතවන සම්පූර්ණ කාළවකවානුව,	**RAMIS පරිගණක පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාකාරී තත්වයට පත් කිරීම සඳහා ගත වන සම්පූර්ණ කාල වකවානුව:** සේවා සපයන්නා සමග ඇතිකර ගන්නා ලද එකඟතාවලට අනුව යමින් මේ වන විට 2017 අංක 24 දරණ නව බදු පනත යටතේ වූ වෙනස්කම් වලට ගැලපෙන පරිදි RAMIS හි සිදු කළ යුතු වූ මූලික වෙනස්කම් සියල්ල සිදු කර අවසන්ව ඇත. ඒ අනුව, තක්සේරු වර්ෂ 2018/2019 සඳහා RAMIS පද්ධතිය මඟින් තක්සේරු නිකුත් කළ හැක. දැනට විකල්ප ක්‍රමවේදය යටතේ තක්සේරු වර්ෂ 2019/2020 සිට 2021/2022 දක්වා තක්සේරු නිකුත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර ඇති අතර, තක්සේරු වර්ෂ 2022/2023 සඳහා තක්සේරු නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
	• RAMIS පරිගණක පද්ධතිය ක්‍රියාකාරී තත්වයට පත් කිරීම සඳහා යම් බාධක (Shortcomings) පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු,	**RAMIS පරිගණක පද්ධතිය ක්‍රියාකාරී තත්වයට පත් කිරීම සඳහා යම් බාධක (Shortcomings) පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු:** RAMIS පරිගණක පද්ධතිය ක්‍රියාකාරී තත්වයට පත් කිරීම සඳහා පැවති බාධක (Shortcomings) මුදල් අමාත්‍යාංශයේ ද මැදිහත්වීම මත මේ වන විට මගහැරී ගොස් ඇත. ▪ දැනට පවතින වැඩි දියුණු කිරීම් වලට අදාල බාධක පිළිබඳව කමිටු වාර්තාවක් මඟින් මුදල් අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

	• RAMIS පරිගණක පද්ධතියේ අවසන් ගෙවීම සිදුකළ පසු එහි හිමිකාරිත්වය (Ownership) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබෙන්නේද යන්න, • RAMIS පරිගණක පද්ධතියේ හිමිකාරිත්වය (Ownership) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබාගැනීම සඳහා වූ වැඩපිළිවෙළ හා එහි හිමිකාරිත්වය ලබාගැනීමට ගතවන කාලය (Time Plan) • RAMIS පරිගණක පද්ධතිය තුළ යම් වෙනස්කම් සිදුවිය යුතු නම් ඒ පිළිබඳව යෝජනාවලියක් මීට අදාළ පිළිතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 04)	**RAMIS පරිගණක පද්ධතියේ හිමිකාරිත්වය (Ownership) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබා ගැනීම සඳහා වූ වැඩ පිළිවෙල හා ලබා ගැනීමට ගතවන කාලය (Time Plan):** RAMIS පද්ධතියේ හිමිකාරිත්වය මේ වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතුව පවතී. නමුත් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය වන පුහුණු කාර්යය මණ්ඩල (විශේෂයෙන් තොරතුරු තාක්ෂණ නිලධාරීන්) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් ඒ සඳහා පද්ධතියේ නිර්මාණකරුගේ සහාය ලබා ගැනීමට සිදුවී ඇත. **RAMIS පරිගණක පද්ධතිය තුල යම් වෙනස්කම් සිදුවිය යුතු නම් ඒ පිළිබඳව යෝජනාවලියක්.** බදු පදනම පුළුල් කිරීම හා වාර්තා අනුකූලතාවය ඉහළ නංවා ගැනීම මගින් රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීම යන කරුණු සලකා බලන විට, E-invoicing ක්‍රමවේදය සහ Unique Digital ID ක්‍රමය ලංකාව තුල හඳුන්වා දීම ආදිය සිදු කළ පසුව RAMIS පද්ධතිය ඒ හා සම්බන්ධ කිරීමට අවශ්‍ය වෙනස්කම් සිදු කළ යුතු බව පෙන්වා දිය හැක. ▪ දැනටමත් **RAMIS** පද්ධතියේ අඩුපාඩු හා යෝජනා ඇතුලත් වාර්තාවක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.
08	<u>විගණකාධිපතිවරයා වෙත ගිවිසුමේ තොරතුරු ලබා නොදීම</u> RAMIS පරිගණක පද්ධතියේ තාක්ෂණික යාවත්කාලීන කිරීම සහ වසර 03 ක් දක්වා නඩත්තු සේවා සැපයීම සඳහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිංගප්පූරු සමාගමක් සමඟ ඇතිකර ලත් ලිවිසුමේ තොරතුරු විගණකාධිපතිවරයා විසින් ඉල්ලා සිටි අවස්ථාවේදී එම තෝරතුරු ලබා නොදීම RAMIS පරිගණක පද්ධතිය මිළදී ගැනීම සහ පවත්වා ගෙන යාම සම්බන්ධ කාර්යය සාධන විගණනයක් ආරම්භ කළ ද මීට අවශ්‍ය තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් විගණනය සඳහා ඉදිරිපත් නොවූ බව විගණකාධිපතිවරයා කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. සිංගප්පූරු සමාගම සමඟ ඇතිකර ගත් ගිවිසුමේ කොන්දේසි අනුව, වෙනත් තුන්වන පාර්ශවයක් සමඟ මෙම RAMIS පරිගණක පද්ධතියට අදාළ ලියකියවිලි හෝ තොරතුරු හුවමාරු කර ගන්නේ නම්, අනෙක් පාර්ශවයේ ලිඛිත එකඟතාවය ලබාගත යුතු බව ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුව, විගණකාධිපතිවරයා විසින් මෙම ගිවිසුමේ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටි අවස්ථාවේදී, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අදාළ සිංගප්පූරු සමාගමෙන් මේ සම්බන්ධයෙන් විමසිමක් කර ඇති බවත්, ඇතැම් තොරතුරු ලබාදීම සඳහා ඔවුන් එකඟතාවය පළකර නොමැති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. මේ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් මෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ද	නීතිපතිවරයාගේ ද අනුමැතිය සහිතව සිංගප්පූරු සමාගම සමඟ ඇතිකර ගත් ගිවිසුමේ කොන්දේසි අනුව වෙනත් තුන්වන පාර්ශ්වයක් සමග RAMIS පරිගණක පද්ධතියට අදාල ලියකියවිලි හෝ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සිංගප්පූරු සමාගමේ ලිඛිත අවසරය ලැබී නොමැති බැවින් අදාල ගිවිසුම් පිටපත් විගණකාධිපතිවරයාට ලබාදීමට නොහැකි වී ඇත. එසේ ලබාදීම ගිවිසුම් කොන්දේසි උල්ලංඝණය කිරීමක් වන අතර ඒ සම්බන්ධව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට එරෙහිව සිංගප්පූරු සමාගම විසින් ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව ඇති බවට නීතිපති දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ද කරුණු ඉදිරිපත් කර ඇත. • දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ගේ අංක CGIR/2022/28 හා 2022.08.08 දිනැති ලිපිය මඟින් සිදු කරන ලද විමසුමට පිළිතුරු වශයෙන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් (වායා ශ්‍රී නම්මුණි) ගේ 2023.01.30 දිනැති ලිපිය මගින් පහත පරිදි දක්වා ඇත. "Given that the Singapore company has refused to give consent to disclosure as stated above, the possibility that such company may institute legal action does exist. The dispute resolution clause provides for arbitration in Hong Kong."

	නීතිපතිතුමාගේ උපදෙස් ඉල්ලා ඇති බව ද කාරක සභාව නිරීක්ෂණය කළේය. මේ පිළිබඳව කාරක සභාවේ විශේෂ අවධානය යොමු වූ අතර, එහි නීතිමය වලංගු භාවය පිළිබඳ නීතිපතිතුමාගේ මතය විමසිය යුතු බව තීරණය කරන ලදී. තවද, මෙම රැස්වීමේදී කාරක සභාව විසින් ලබාදෙන නියෝග සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුරු වාර්තාවන් පිළිබඳව සැහීමකට පත්විය නොහැකි නම් විගණකාධිපතිවරයා විසින් RAMIS පද්ධතිය සම්බන්ධයෙන් ගණුදෙනු විගණනයක් (Transaction Audit) සිදුකිරීම අවශ්‍ය බව කාරක සභාව පෙන්වා දුන්නේය.	
09	<u>අගරු චෙක්පත් මඟින් ගෙවන ලද බදු අය කිරීමේ කටයුතු කාර්යක්ෂමව සිදු නොවීම</u> අගරු චෙක්පත් මඟින් ගෙවන ලද බදු අය කිරීමේ කටයුතු කාර්යක්ෂමව සිදු නොවීම සහ චෙක්පත් වෙනුවට බදු ගෙවීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක නොවීම. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2022 ජූනි 30 දිනට Legacy හා RAMIS පද්ධති වලට අදාල අගරු චෙක්පත් පරීක්ෂාවේදී, i. 2022 ජූනි 30 දින වන විට Legacy හා RAMIS පද්ධති වලට අදාළව රු. 2,488,003,615 ක් වටිනා අගරු වූ චෙක්පත් 4831 ක් පවතින බව නිරීක්ෂණය විම. ii. එම අගරු චෙක්පත් වලින් රු.1,429,356,750 ක් වටිනා චෙක්පත් 3,817 ක් වසර 3ට වඩා පැරණි ඒවා විම. iii. බදු ගෙවන්නන් විසින් එකතු කළ අගය මත බදු වශයෙන් රැස්කර චෙක්පත් මඟින් ගෙවනු ලැබූ බදු වලට අදාළව රු.1,980,596,605 ක් වටිනා චෙක්පත් 3,471 ක් අගරු වී තිබුණු අතර, එය මුළු චෙක්පත් වටිනාකමෙන් 80% ක් විම. මෙලෙස අගරු වූ චෙක්පත් ලබාදෙන ආයතන සම්බන්ධයෙන් නිතිමය ක්‍රියාමාර්ග නොගැනීම ගැටළුකාරී තත්වයක් බව කාරක සභාව අවධාරණය කළ අතර චෙක්පත් වෙනුවට බංකු ඇපකර (Bank Guarantee) හරහා ගෙවීම් සිදු කිරීම වඩා ඵලදායී බව පෙන්වා දුන්නේය. කාරක සභාවේ ඉල්ලීම මත 2008 වසරේ සිට 2022.11.22 දක්වා අගරු වූ චෙක්පත් පිළිබඳ ලේඛණයක් ග.නි. විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලදි.	i. 2023.12.31 දින වන විට නිරවුල් කිරීමට ඇති අගරු වූ චෙක්පත් ප්‍රමාණය 3174 ක් වන අතර එහි වටිනාකම රු. 1,948,707,727.85 ක් වේ. ii. එම අගරු චෙක්පත් වලින් රු. 951,419,883.55 ක් වටිනා චෙක්පත් 2,516 ක් පමණක් වසර 3 කට වඩා පැරණි ඒවා වේ. iii. 2023.12.31 දිනට බදු ගෙවන්නන් විසින් එකතු කළ අගය මත බදු වශයෙන් රැස්කර චෙක්පත් මඟින් ගෙවනු ලැබූ බදු වලට අදාළව රු. 1,498,999,221.10 ක් වටිනා චෙක්පත් 2,223 ක් අගරු වී ඇත. අගරු චෙක්පත් අයකර ගැනීම පිළිබඳව පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත. ▪ චෙක්පත් වෙනුවට බැංකු අණකර (Bank Draft) මගින් ගෙවීම් සිදු කිරීමේ දී අය කරන ගාස්තුව සංශෝධනය කිරීමේ හැකියාව පිළිබඳ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2023.09.27 දිනැති ලිපිය මගින් මහ බැංකු අධිපති වෙතින් සිදුකරන ලද විමසීම සඳහා 2024.01.17 දිනැති ලිපිය මගින් ලැබී ඇති පිළිතුර අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව එම ගාස්තුව අයකිරීම සම්බන්ධයෙන් සෘජුවම මැදිහත් නොවන බවත්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය මගින් බැංකු වලින් විමසා බැලූ කල්හී, පිරිවැය ඉහළ යාම හේතුවෙන් දැනට බැංකු අණකර සඳහා බැංකු විසින් අයකරන ගාස්තු සාධාරණ බවත් දන්වා ඇත.

	<u>නිර්දේශ/නියෝග</u> - එසේම ගෙවීම් සිදුව නොමැති අගරු චෙක්පත් අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කළේය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මාසයකින් යලි කාරක සභාව හමුවට කැඳවන බව කාරක සභාව අවධාරණය කළේය. එම අවස්ථාවට බදු අභියාචනා කොමිෂමේ සාමාජිකයින් ද, මෙම පද්ධතිය හා සම්බන්ධ වන මොරටුව විශ්ව විද්‍යාලයේ නිලධාරීන් හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ද කැඳවීමට කාරක සභාව තීරණය කළේය.	▪ මුදලින්, බැංකු අණකර මඟින් හා මාර්ගගත ක්‍රමය මගින් බදු ගෙවීමට අමතරව චෙක්පත් මගින් බදු ගෙවීම් සිදුකිරීමේ දී චෙක්පත් අගරුවීමේ ප්‍රවණතාවය හේතුවෙන් චෙක්පත් මගින් බදු ගෙවීමට අවස්ථාව ලබා දීම නවතාලීම සහ බැංකු අණකර මගින් ගෙවීම් සිදු කිරීම පිළිබඳව අනුමැතිය ඉල්ලා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2023.10.03 දිනැතිව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යොමු කර ඇති අතර, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරුන් වෙත පිටපත් යොමු කර ඇත. ▪ 2023.05.25 වන දින නීතිපති වෙතින් කරන ලද විමසීමට ලද පිළිතුර මගින් ලැබුණු උපදෙස් පරිදි නීති අංශය විසින් ඒ පිළිබඳව කටයුතු කර ඇත. ▪ සියළුම අගරු වූ චෙක්පත් සඳහා ගෙවීම් කිරීම පිළිබඳව විමසීම හා දැනටමත් ගෙවීම් කර ඇත්නම් ඒ පිළිබඳව අදාළ ලේඛන සමග දැනුම් දෙන ලෙස දන්වා ලියාපදිංචි තැපැල මඟින් යැවීමට විශේෂයෙන් සකස් කල ලිපියක් බදු ගෙවන්නා වෙත යොමු කරන ලෙස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2023.09.27 දින අගරු චෙක්පත් පරිපාලනය කරනු ලබන සියලුම අංශවල කොමසාරිස්වරුන් වෙත දැනුම් දී ඇති අතර, ඒ අනුව ලිපි නිකුත් කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. ▪ එම අගරු වූ චෙක්පත් අයකර ගැනීමට අදාළව යවන ලද ලිපි සඳහා යම් හෙයකින් ප්‍රතිචාර නොලදහොත් හෝ ආපසු ලැබීම් සිදුවුවහොත් ඒවා සඳහා පහත පියවර අනුගමනය කරන ලෙස හා අදාළ පරීක්ෂණ වාර්තා සකස් කර ඉදිරිපත් කරන ලෙස අංශභාර කොමසාරිස්වරුන් වෙත දැනුම් දී ඇත. <u>යවන ලද ලිපිය ආපසු ලැබී ඇත්නම් :</u> i. පද්ධතිය තුල වෙනත් ලිපිනයක් හෝ දුරකතන අංකයක් තිබේද යන්න පරීක්ෂා කිරීම ii. දුරකතනය මගින් බදු ගෙවන්නා සම්බන්ධ කර ගැනීමට ක්‍රියා කිරීම iii. වෙනත් ලිපිනයක් සොයා ගත හැකි නම්, එම දෙවෙනි ලිපිනයට ලිපිය නැවත තැපැල් කිරීම <u>යවන ලද පළමු හා දෙවන ලිපි දෙකම ආපසු ලැබී ඇත්නම් :</u> i. ග්‍රාම නිලධාරී මගින් විමසීම ii. තැපැල් කාර්යාලය මගින් විමසීම iii. ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීම ඉහත ක්‍රමවේද අනුගමනය කිරීමෙන් 2023.12.31 දින වන විට අගරු වූ චෙක්පත් ප්‍රමාණය 3174 ක් දක්වා අඩුකර ඇත.

		▪ චෙක්පත් මගින් බදු ගෙවීම පිළිබඳව බදු ගෙවන්නන් දැනුවත් කිරීම කළ යුතු ආකාරය පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කර ඇත. ▪ චෙක්පත් තුනකට වඩා වැඩියෙන් අගරුවීම් සිදු වී ඇති බදු ගෙවන්නන් අසාදු ලේඛන ගත කර 2019 ඔක්තෝබර් මස සිට දෙපාර්තමේන්තු අභ්‍යන්තර ජාලයේ දැනටමත් ප්‍රසිද්ධ කරමින් පවතින අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමේ හැකියාව ද අධ්‍යයනය කරමින් පවතී. ▪ චෙක්පත් නිෂ්කාශණය වූ පසුව පමණක් දෙපාර්තමේන්තු පද්ධතිය වෙත ගෙවීම ලබා දීම ලංකා බැංකුව විසින් 2023 අගෝස්තු මස සිට සිදු කරමින් පවතී. ▪ ඉහත අංක 3.9 හි සඳහන් පරිදි කටයුතු කිරීමේ දී අගරු වූ ගෙවීම් පද්ධතිය වෙත ලබා ගැනීම, වැඩ අයිතම නිර්මාණය වීම, අදාළ ලිපි ලේඛන බදු ගෙවන්නන් වෙත යොමු කිරීම සහ ඒවාට අදාළ වාර්තා ජනනය කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු පද්ධති සංවර්ධන කටයුතු සිදු කළ යුතු බැවින් RAMIS ව්‍යාපෘතියේ අදාළ කටයුතු සිදු කරනු ලබන NCS ආයතනය වෙත ඒ පිළිබඳව දැනුම් දී ඇත. ▪ ලංකා බැංකුව හා මහජන බැංකුව විසින් චෙක්පත් නිශ්කාශනය වූ පසුව පමණක් පද්ධතිය වෙත ගෙවීම් ලබා දෙන බැවින් පෙර මෙන් චෙක්පත බැංකුව වෙත ලබා දුන් දිනයේම පද්ධතිය වෙත ගෙවීම් කළා සේ සලකනු නොලබන බව හා ප්‍රමාද ගෙවීම් මත අදාළ දණ්ඩන පැනවීම සිදු විය හැකි බව බදුගෙවන්නන් දැනුවත් කිරීම සඳහා දැන්වීම් පල කිරීමේ කටයුතු සිදු කර ඇත.

2023.12.31 දිනට ප්‍රගතිය

අදාළ රාජ්‍ය ආයතන 05 විසින් කරන ලද VAT ගෙවීම් නැවත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය වීම පිළිබඳව කරන ලද විගණන විමසුම් සඳහා ලද පිළිතුරු අනුව 2023.12.31 දින දක්වා අදාළ බදු කරුවන් විසින් VAT බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය වීමේ ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

	Quari No	VAT වටිනාකම (රු.)	VAT එකතු කළ ප්‍රමාණය (රු.)	VAT සඳහා තක්සේරු නිකුත් කළ ප්‍රමාණය (රු.)	විගණනය ආරම්භ කර ඇති ප්‍රමාණය (රු.)	ඉවත් කළ බදු	වැරදි බිල්පත් කොරතුරු	වැඩ අයිතම ආරම්භ කර ඇති
ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය	PUR/D/IRD/2021/AQ/26	2,031,445.64	1,119,673.76	56,859.69	743,605.00	43,803.89		
මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය	PUR/D/IRD/2021/AQ/30	10,939,806.00	44,135,475.53	87,455,980.00	1,204,610.09	-		
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සේවා පුද්ගලික සමාගම	PUR/D/IRD/2021/AQ/31	7,546,338.00	4,219,880.00	45,116.10	49,306.42	-	178,530.65	
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ අධිකාරිය	PUR/D/IRD/2021/AQ/33	130,352,827.00	73,191,001.00	54,181,723.59	19,148,175.00			
මාර්ග සංවර්ධන අධිකාරිය	PUR/D/IRD/2021/AQ/34	41,221,000.74	3,135,325.63	3,682,094.17	3,609,791.68			13,616,379.15
TOTAL		**192,091,417.38**	**125,801,355.92**	**145,364,913.86**	**24,755,488.19**		**178,530.65**	**13,616,379.15**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 77

ආයතනයේ නම :- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

විමර්ශනය කරන ලද දිනය :- 2023.01.24

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය
01.	<u>සේවා ගිවිසුම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් නොකිරීම.</u> දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) සහ සිංගප්පූරු සමාගම අතර ඇතිකරගත් සේවා ගිවිසුම විගණකාධිපතිවරයා විසින් ඉල්ලා සිටි අවස්ථාවේදී, ගිවිසුමට අදාළ අනෙක් පාර්ශ්වයේ ලිඛිත අවසරයකින් තොරව ගිවිසුමේ තොරතුරු වෙනත් තුන්වන පාර්ශවයකට ලබා දිය නොහැකි බව දැක්වෙන ගිවිසුමේ රහස්‍යභාවයට අදාළ වගන්තියක් අඩංගු බව පවසමින් දේශීය ආදායම් දේපාර්තමේන්තුව එම සේවා ගිවිසුම ලබාදීම ප්‍රතික්ෂේප කර තිබීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (5) (ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණන විමසුමට අදාළ අවශ්‍ය සියලම ලියකියවිලි කැඳවීමට විගණකාධිපතිවරයාට බලය ඇති බවත් , ජාතික විගණන පනතේ 6 (3) වගන්තියේ නියමයන් අනුවද විගණකාධිපතිවරයාට එවැනිම බලයක් පැවරී ඇති බවත් නීතිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පැමිණ සිටි නිලධාරියා ප්‍රකාශ කළේය. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ප්‍රකාරව ලේඛන කැඳවීමට විගණකාධිපතිවරයාට පැහැදිලිවම නෛතික බලය ඇති බව කාරක සභාවේදී අනාවරණය වූ අතර විගණකාධිපතිවරයාගේ ඉල්ලීමට එකඟ නොවීම ජාතික විගණන පනතට අනුව වරදක් ලෙස හඳුනා ගැනෙන බවද මෙහිදී අනාවරණය විය. මෙහිදී අදහස් දක්වමින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරී වැඩිදුරටත් පවසා සිටියේ, අදාළ සිංගප්පූරු සමාගම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතර අත්සන් කර ඇති සේවා ගිවිසුම ප්‍රකාරව, එම ගිවිසුමේ කොන්දේසි කඩකළහොත්, ගිවිසුම කඩකිරීම සම්බන්ධයෙන් සිංගප්පූරු සමාගම විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට එරෙහිව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව ඇති බවයි.	නීතිපතිවරයාගේ ද අනුමැතිය සහිතව සිංගප්පූරු සමාගම සමඟ ඇතිකර ගත් ගිවිසුමේ කොන්දේසි අනුව වෙනත් තුන්වන පාර්ශ්වයක් සමග RAMIS පරිගණක පද්ධතියට අදාල ලියකියවිලි හෝ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සිංගප්පූරු සමාගමේ ලිඛිත අවසරය ලැබී නොමැති බැවින් අදාල ගිවිසුම් පිටපත් විගණකාධිපතිවරයාට ලබාදීමට නොහැකි වී ඇත. එසේ ලබාදීම ගිවිසුම් කොන්දේසි උල්ලංඝණය කිරීමක් වන අතර ඒ සම්බන්ධව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට එරෙහිව සිංගප්පූරු සමාගම විසින් ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව ඇති බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයාගේ විමසුමට පිළිතුරු වශයෙන් නීතිපති වරයා විසින් ලිඛිතව දැනුම් දී ඇත. • දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ගේ අංක CGIR/2022/28 හා 2022.08.08 දිනැති ලිපිය මඟින් සිදු කරන ලද විමසුමට පිළිතුරු වශයෙන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් (වායා ශ්‍රී නම්මුණි) ගේ 2023.01.30 දිනැති ලිපිය මගින් පහත පරිදි දක්වා ඇත. "Given that the Singapore company has refused to give consent to disclosure as stated above, the possibility that such company may institute legal action does exist. The dispute resolution clause provides for arbitration in Hong Kong."

02.	<u>සේවා ගිවිසුම අත්සන් කිරීමට පෙර සේවා ගිවිසුමේ කොන්දේසි නීතිපතිවරයා විසින් නිෂ්කාශනය කර තිබේද යන්න පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය.</u> 2014 දී අත්සන් කරන ලද සිංගප්පූරු ඩොලර් මිලියන 35 ක වටිනාකමින් යුත් මූලික ගිවිසුම සඳහා නීතිපතිවරයාගේ අවසරය ලබා ගෙන ඇති බව මෙහිදී අනාවරණය විය. ඊට අමතරව, RAMIS හි මීළඟ අදියර වන RAMIS 2.0 සංවර්ධනය කිරීම සඳහා 2017 දී අත්සන් කරන ලද සේවා ගිසිසුමේ වටිනාකම සිංගප්පූරු ඩොලර් මිලියන 15.5 ක් බව අනාවරණය වූ අතර එම සේවා ගිවිසුමේ ඇතුළත්ව ඇති රහස්‍යභාවයට අදාළ වගන්තිය හේතුවෙන් සේවා ගිවිසුමේ පිටපතක් නීතිපතිවරයා වෙත ඉදිරිපත්ව නොමැති බවත් ගිවිසුමේ ඇතැම් කොටස්වලට අදාළ තොරතුරු පමණක් හුවමාරු වී ඇති බවත් වැඩිදුරටත් අනාවරණය විය. ගිවිසුමේ තොරතුරු හුවමාරු කර නොගැනීමට හේතුවන එවැනි වගන්තියක් ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය කමිටුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි. ගෙන් විමසා සිටිය අතර, මෙය පැහැදිලි කර ගැනීම සම්බන්ධව අදාළ පාර්ශ්වය සමග සාකච්ඡා පවත්වා ඇත්ද යන්න පිළිබඳ වැඩිදුරටත් විමසා සිටියේය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ සම්බන්ධයෙන් සිංගප්පූරු සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ විධායක අධ්‍යක්ෂ සමග සාකච්ඡා කළ බව ග.නි. ප්‍රකාශ කළ අතර, එහිදී විගණකාධිපතිවරයා වෙත ගිවිසුම ලබා දීමට ඔවුන් එකඟ නොවූ බව ප්‍රකාශ කළේය. ගෙවීම් සම්බන්ධ ගිවිසුමේ වගන්ති දැනටමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් උල්ලංඝණය කර ඇති බැවින් වෙනත් වගන්තියක් කඩ කළහොත් ගැටලුවක් මතුවිය හැකි බවද ග.නි වැඩිදුරටත් ප්‍රකාශ කළේය.	RAMIS ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම ඒ සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලබාගෙන ඇත.

03.	**RAMIS** ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය අවසාන ගෙවීමෙන් පසු RAMIS ව්‍යාපෘතියේ හිමිකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු වන බවත්, RAMIS හි මීළඟ අදියර වන RAMIS 2.0හි වැඩිදියුණු කිරීම් සිදුවෙමින් පවතින බව සහ පද්ධතියේ නඩත්තු කටයුතු සිංගප්පූරු සමාගම විසින් සිදුකරන බවත් ග.නි ප්‍රකාශ කළේය. RAMIS 2.0 සඳහා වූ සිංගප්පූරු ඩොලර් මිලියන 15.5 න් ඩොලර් මිලියන 6 ක් දැනටමත් ගෙවා ඇති බවත් ඉතිරි සිංගප්පූරු ඩොලර් මිලියන 9.5 ක මුදල ඔවුන්ට ගෙවිය යුතුව ඇති බවත් මෙහිදී අනාවරණය විය. පද්ධතිය සඳහා තුන්වන පාර්ශ්ව සමාලෝචකයෙකු සිටිය යුතු බවට මූලික ගිවිසුමේ වගන්තියක් ඇතුළත්ව තිබූ හෙයින්, 2015 වසරේ සිට මොරටුව විශ්වවිද්‍යාලය විසින් RAMIS පද්ධතිය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත උපදේශන සේවා සපයනු ලබන බව මොරටුව විශ්වවිද්‍යාලය නියෝජනය කරන නිලධාරියා ප්‍රකාශ කළේය. මානව ප්‍රාග්ධන ප්‍රශ්නය සහ සේවාදායක/ යටිතල පහසුකම් ප්‍රශ්නය පෙන්වා දෙමින් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේ RAMIS හි පූර්ණ ප්‍රයෝජනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීම සඳහා අංශ දෙකක් කෙරෙහි අවධානය යොමු කළ යුතු බවයි. එනම් පළමුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර සංවර්ධන කණ්ඩායමක් සිටීද යන්න සහ දෙවනුව බදු වසම (taxation domain) තුළ දේශීය සේවා සපයන්නන් සොයා ගැනීම අභියෝගාත්මක බැවින් වසම් විශේෂඥතාව ලබා ගන්නා දක්ෂ දේශීය සේවා සපයන්නෙකු සිටීද යන්නයි.	RAMIS පද්ධතිය, වර්තමානයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පරිපාලනය කරනු ලබන SSCL (සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද) සහ B & GL (ඔට්ටු සහ සූදු බද්ද) හැර සියළුම බදු වර්ග පරිපාලනය සඳහා සකස් කොට ක්‍රියාත්මක වෙමින් පවතී. SSCL, RAMIS පද්ධතිය තුළ ස්ථාපිත කිරීමේ සංවර්ධන කටයුතු මේ දිනවල සිදු කරමින් පවතී. 2023 දෙසැම්බර් 31 තෙක් නිකුත් වී ඇති ඉන්වොයිස් සඳහා සියලු ගෙවීම් සිදු කර ඇත. RAMIS පද්ධතියේ අඩුපාඩු සහ යෝජනා ඇතුලත් වාර්තාව මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු මුදල් අමාත්‍යාංශයේ මැදිහත්වීම් මත ඉදිරියේ දී සිදුවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.
04.	**RAMIS** ව්‍යාපෘතිය සඳහා පුහුණු නිලධාරීන් RAMIS ව්‍යාපෘතියට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩල සාමාජිකයින් 90 දෙනෙකු පමණ දැනටමත් පුහුණු කර ඇති බව හා රාජ්‍ය අංශයේ වැටුප් පරිමාණයන් සාපේක්ෂව ඉතා අඩු බැවින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ විශේෂඥයින්ගේ සේවාව ලබා ගැනීමේ ගැටළු පවතින බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය. දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් මෘදුකාංග පද්ධති ගොඩනගන දක්ෂ මෘදුකාංග සමාගම් ශ්‍රී ලංකාව තුළ ඇති බැවින් එම සේවාව බාහිරින් ලබා ගැනීමේ හැකියාවක් පවතින බව අනාවරණය විය.	බදු කටයුතු සඳහා විශේෂිත වූ නිලධාරීන් දෙපාර්තමේන්තුව තුලින් සොයාගත හැකි වූවත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විශේෂඥයින්ගේ සේවාව ලබා ගැනීමේ ගැටළු පවතී. මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ කමිටු වාර්තාව අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබනු ඇතැයි අපේක්ෂා කරමි.

05.	<u>බදු පරිපාලනය සඳහා නව ගෝලීය මූලපිරීම්.</u> බදු පරිපාලනයේ නව තාක්ෂණික මූලපිරීම් කරා ඇතැම් රටවල් දැනටමත් ගමන් කරමින් සිටින බව තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය නියෝජනය කරමින් පැමිණ සිටි නිලධාරියා විසින් පෙන්වා දුන්නේය. නිදසුනක් ලෙස එක්සත් රාජධානියේ ක්‍රියාත්මක බදු ඩිජිටල්කරණය (Making Tax Digital) (MTD) හරහා පද්ධතියේ මූලික API සෑදීම සඳහා පමණක් රජය අවම මුදලක් වැය කර ඇත. මීට අමතරව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වෙනත් රාජ්‍ය ආයතනවල පද්ධති සමඟ සම්බන්ධ වීමට අවශ්‍ය නම්, පද්ධතිය සැලසුම් කිරීමේදී දේශීය ආදායම් දේපාර්තමේන්තුවෙහි API වෙනත් පද්ධතිවල ඇතුළත් (written) කළ යුතු බව මෙහිදී අනාවරණය විය. මීට පෙර රාජ්‍ය ආයතන අතර රැස්වීම් සඳහා පහසුකම් සලසන අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පැවති බවත් එය පසුගිය කාලයේ රැස් නොවූ බවත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) නියෝජනය කරන නිලධාරියා විසින් ප්‍රකාශ කළේය. <u>නිර්දේශ / නියෝග</u> RAMIS පද්ධතිය නිවැරදිව තක්සේරු කිරීම සහ ඇගයීම සඳහා තාක්ෂණික කමිටු දෙකක් පිහිටුවීමට සහ පහත පරිදි RAMIS පද්ධතිය නිවැරදිව ක්‍රියාත්මක කිරීමේ මාර්ග හඳුනා ගැනීමට කමිටුව තීරණය කළේය. • තාක්ෂණික කමිටුව 01 - තාක්ෂණික සහ අදාළ ගැටළු විසඳීමට සහ RAMIS වැඩිදියුණු කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම. අදාළ පිළිතුරු වාර්තාව ඉදිරිපත් කර ඇත. ඉහත තාක්ෂණික කමිටුව - 01, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සභාපතිවරයා විසින් සම්බන්ධීකරණය කරන ලෙසත්, ඒ සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (පරිගණක/ තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානියා, RAMIS හි ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළුව), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, මොරටුව විශ්ව විද්‍යාලය නියෝජනය කරනු ලබන නිලධාරීන් සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් සම්බන්ධ කරගන්නා ලෙසත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සභාපතිවරයා වෙත කාරක සභාව නියෝග කළේය.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතියට Web හරහා දත්ත සැපයීමට හැකි වන ලෙස පද්ධති සංවර්ධනය කළ යුතු අතර, එම ප්‍රමිතීන්ට අනුව දත්ත සකස් කළ යුතු වේ. උදාහරණ ලෙස පුද්ගලයකු නම් NIC අංකයද, සමාගමක් නම් සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය ද ලෙස අනන්‍ය වූ අංකයක් (Unique Number) හඳුන්වා දිය යුතු ය.

	තවද, බදු පනත් සංශෝධන සමඟ අවශ්‍යතා සපුරමින් RAMIS හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ භාවිතය උපරිම කිරීම සඳහා ඔවුන්ගේ යෝජනා සහ සැලැස්ම කාලරාමුවක් සහිතව සති හයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් තාක්ෂණික කමිටුව - 01 වෙත නියෝග කරන ලදී. • තාක්ෂණික කමිටුව 02 - පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා පවතින නීතිමය රාමුව තුළ RAMIS වෙනස් කිරීමේ හැකියාව සොයා ගැනීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් සහ සම්බන්ධීකරණයෙන් සහ මුදල් අමාත්‍යාංශය, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන්ගෙන් සමන්විතව ඉහත තාක්ෂණික කමිටුව - 02 පිහිටුවීමට කාරක සභාව උපදෙස් දෙන ලදී. තවද, ඉහත තාක්ෂණික කමිටු - 01 ට ඔවුන්ගේ යෝජනා / සැලසුම් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බැලීමට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සිංගප්පූරු සමාගම අතර ඇති කර ගත් ගිවිසුමට අනුව RAMIS වෙනස් කිරීමේ හැකියාව පිළිබඳව නීතිමය මතයක් සහ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් තාක්ෂණික කමිටුව - 02 වෙත නියෝග කරන ලදී.	

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 77 සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ. සේපාලිකා චන්ද්‍රසේකර
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් විත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ-02.